# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2322/47 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළ කරන ලද අංක 2317/21 හා 2023.01.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 වැනි දින නොපැවැත්වෙන බව ද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව විසින් මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වැනි දිනය මවිසින් මෙයින් නියම කරන බව ද,

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (සංශෝධිත) 38(1)(ඇ) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ජේ.එම්.ජේ.කේ.ජයසුන්දර,**
තේරීම්භාර නිලධාරි,
අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39065 — 31 (2023/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

අනුරාධපුර මහා නගර සභාව
මැදවච්චිය ප්‍රාදේශීය සභාව
රඹෑව ප්‍රාදේශීය සභාව
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව
පදවිය ප්‍රාදේශීය සභාව
කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව
හොරොව්පතාන ප්‍රාදේශීය සභාව
ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය සභාව
තලාව ප්‍රාදේශීය සභාව
නැගෙනහිර නුවරගම්පළාත ප්‍රාදේශීය සභාව
මධ්‍යම නුවරගම්පළාත ප්‍රාදේශීය සභාව
නොච්චියාගම ප්‍රාදේශීය සභාව
රාජාංගනය ප්‍රාදේශීය සභාව
ගල්නෑව ප්‍රාදේශීය සභාව
ඉපලෝගම ප්‍රාදේශීය සභාව
මිහින්තලේ ප්‍රාදේශීය සභාව
තිරප්පනේ ප්‍රාදේශීය සභාව
කැකිරාව ප්‍රාදේශීය සභාව
පලාගල ප්‍රාදේශීය සභාව

EOG 03 - 0105

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.